# වාසනාවන්ත සුසී



ආර්.බී.රශ්මි ප්‍රබෝධා

# වාසනාවන්ත සුසී

ආර්.බී.රශ්මි ප්‍රබෝධා

1 ශ්‍රේණිය A

මහ/ මහාමායා බාලිකා විදුහල

කතාව සහ චිත්‍ර

ආර්.බී.රශ්මි ප්‍රබෝධා

ISBN 978-624-206-957-9

කතෘ ප්‍රකාශනයකි

2023

# පිදුම

සිප් සතර කියා දුන්

දමයන්ති රත්නායක ගුරුතුමියටත්,

ආදරණීය දෙමව්පියන්ටත්,

මාගේ යෙහෙළියන්ටත්

ඉතා ආදරයෙන්

මෙම ග්‍රන්ථය

පුද කරමි

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන  ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහා ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී.දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම  ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර
2023/11/04

එක්තරා පිටිසර ගම්මානයක සුසී කියලා ගැහැණු ළමයෙක් සිටියා.

ඇය සමඟ අම්මා, තාත්තා, නංගී ජීවත් වුණා.



සුසීගේ තාත්තා මාළු අල්ලාගෙන නගරයට ගොස් වෙළඳාම් කළා.ඔහුට කවුරුත් කීවේ මාළු මාමා කියලා.



සුසීගේ පවුලෙ අය ජීවත් වුණේ තාත්තා මාළු විකුණා ගෙනෙන කාසි වලින් ය.



දිනක් උදෑසන මාළු අල්ලා ගැනීමට මුහුදු යන්න සූදානම් වුණ සුසීගේ තාත්තා දුටුවා සුළඟ සමඟ මහ වැස්සක් එනවා.



සුසීගේ තාත්තාට බොහෝ දිනක් මුහුදු යන්න බැරි වුණා.

වැස්ස දිගින් දිගටම අකුණු සුළං සමඟ වැඩි වුණා.

තාත්තාට මුහුදු යන්න බැරි වූ නිසා පුංචි සුසී ගොඩක් දුක් වුණා.



දිනක් සුසී මහ වැස්සේ ගෙදරට හොරෙන් මුහුද ළඟට ගියා.

මහ හයියෙන් ඇඬුවා.

සොබාදහම සුසීට ගොඩක් ආදරේ වුණා. මහ වැස්ස එක පාරටම නතර වුණා.

සුසී ගෙදර නැති බව දැක, ගෙදර හැමෝම බිය වී සුසීව සෙව්වා.



සුසී මුහුදු වෙරළ ළඟ වාඩි වුණා, මුහුද සමඟ කතා කළා.

එක පාරටම දිය කිඳුරියක් ආවා.

දිය කිඳුරිය සුසීට වටිනා ලස්සන මුතු ඇටයක් දුන්නා.

සුසීට පුදුම සිතුණා.




තාත්තාට සිතුණා මුහුදු වෙරළට යන්න. තාත්තා ගෙදර අය සමඟ මුහුදු වෙරළට එනවා දුටු දිය කිඳුරිය නොපෙනී ගියා.

සුසීට දුක හිතුණා.

සුසී මුතු ඇටය තාත්තාට දුන්නා.

සිදු වූ සියල්ල සුසී ගෙදර අයට කිව්වා.



සුසීගේ තාත්තා නගරයට ගොස් මුතු ඇටය විකුණා කාසි සොයා ගත්තා.

සුසී හරිම වාසනාවන්තයි කියලා ගෙදර හැමෝම සුසීගේ ඔළුව අතගෑවා.

සුසීගේ පවුලේ අය ගොඩක් සතුටින් කාලය ගත කළා.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය.පාසල තුළ ගොඩනැගී ඇති ලේකන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 04

ISBN 978-624-206-957-9